03

**Samōdhāna: The Journal of Faculty of Social Sciences and Humanities**
2016, Vol. 5 (II) 29-47pp
© The Author 2016
Ed. *Chandana Rohana Withanachchi*
Pub. *Publication Section of the Faculty of Social Sciences & Humanities, Rajarata University of Sri Lanka, Mihintale.*
ssh.samodhana@gmail.com

# එකොළොස්වැනි සියවසේ සිට දහතුන්වැනි සියවස දක්වා ශ්‍රී ලාංකේය රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවන්හි උපාය මාර්ගික වැදගත්කම

ආචාර්ය එම්.කේ.එල්. අයිරාංගනී[1]

## Abstract

The kings, who ruled in Polonnaruwa period, used greatest diplomatic strategies in achieving unique political and economic development within a short period of history. This study critically analyzed the strategic significance of diplomatic relationship in 11th to 13th century in Sri Lanka. The study largely relied on the primary sources. Secondary sources were also used in further establishing the evidence of primary sources. The analysis indicated innovative approaches in diplomatic relationship adopted by the Kings during the Polonnaruwa period compared to traditional approaches adopted in the Anuradhapura period. Specifically, the Kings in the Polonnaruwa period had established the diplomatic relationship with the countries by taking into account changes in regional politics and direction of changes in regional economies, the Indian Ocean trade in particular. As a result of use of the greatest diplomatic strategies with profound knowledge in regional politics, the Kings had been able to eliminate foreign inversions, achieve a unique political development and trade boom, and upgrade the country's identity and dignity in the region.

**Key Words;** History, Polonnaruwa Period, Deplomatic Relationship,

[1] *Senior Lecturer in History, Department of Humanities, Rajarata University of Sri Lanka. Mihintale.* *iranganimkl@yahoo.com*

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකාව පාර සමුද්‍රීය රාජ්‍යයන් සමඟ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පවත්වා ගැනීමේ ඉතිහාසය ලිඛිත මූලාශ්‍රයනට අනුව ක්‍රි.පූ. තෙවැනි සියවස දක්වා ඈතට ගමන් කරයි (*මව.* XI:19-24). එතැන් සිට දේශීය පාලකයින් විවිධ පාර්ශව ඔස්සේ තදාසන්න ඉන්දියාව සමඟත් රෝමය වැනි බටහිර රටවල් සමඟත් චීනය වැනි ඈත පෙරදිග රටවල් සමඟත් සම්බන්ධතා වැඩි දියුණු කර ගනිමින් තිබුණි. මෙම සම්බන්ධතා හරහා සංස්කෘතික ආභාසයන් හුවමාරු කරගැනීම, දේශපාලන උපකාර හුවමාරු කරගැනීම සහ වාණිජ කටයුතු පුළුල් කරගැනීම වැනි බහුවිධ අපේක්ෂා පැවතුණි. අනුරාධපුර රාජධානි සමයේ අන්තර් රාජ්‍ය සම්බන්ධතා සැළකිය යුතු මට්ටමකින් පැවතියත්, එම සම්බන්ධතා සංස්කෘතික හා දේශපාලන අරමුණු වටා සංකේන්ද්‍රගත වූ ක්‍රියාවලියක් මිස පොළොන්නරු රාජධානි අවධියේ මෙන් ඍජුවම විදේශ වෙළඳාම ඉලක්ක කරගත් රාජ්‍ය තාන්ත්‍රික උපාය මාර්ගයක් ලෙස ක්‍රියාගත වූ බවක් නොපෙනේ. එබැවින් අනුරාධපුර රාජධානි සමයේ සිට පැවති සාම්ප්‍රදායික ගමන් මගින් ව්‍යුක්ත වූ විශේෂිත ලක්ෂණ රැසක් පෙන්නුම් කරන එකොළොස්වැනි සියවසේ සිට දහතුන්වැනි සියවස අවසානය දක්වා මෙරට රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතාවයන්හි උපායමාර්ගික ස්වභාවය තාර්කිකව විමසුමට බඳුන් කිරීම මෙම අධ්‍යයනයෙහි අරමුණ වේ.

ඉතාමත් කෙටි කාලයක් තුළ ආකර්ශනීය දේශපාලන හා ආර්ථික වර්ධනයක් ලඟාකර ගත් පොළොන්නරු පාලකයෝ ඒ සඳහා රාජ්‍ය තාන්ත්‍රික ඥානය ද මනාව උපයෝගී කර ගත්හ. කලාපීය දේශපාලනය බල තුලනයන් හා වෙනස් වන ආර්ථික දිශානතීන් පිළිබඳ මනා වැටහීමකින් යුතුව මෙකල පාලකයින් විදේශයන් සමඟ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ගොඩනගා ගැනීමත් පවත්වා ගැනීමත් තීක්ෂණ අයුරින් සිදුකළ බව ඓතිහාසික සාක්ෂි විභාගයේදී පෙනීයයි. තත් කාලවාකවානුව වන විට ඉන්දීය සාගර වාණිජ කටයුතු තුළ සක්‍රීය මැදිහත් කරුවන් වූ දකුණු ඉන්දීය රජ පෙළපත්, අග්නිදිග ආසියානු රටවල්, අරාබි අධිරාජ්‍යය මුල් කරගත් මුස්ලිම්වරු මෙන්ම පෙරදිග ප්‍රධාන වාණිජ සැපයුම්කරුවා වූ චීනයත් සමඟ මෙම සමීප රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පවත්වා ගෙනයාමට පොළොන්නරු පාලකයෝ උනන්දු වූහ.

## 2. පොළොන්නරු පාලකයින්ගේ විදේශ ප්‍රතිපත්තියෙහි බහුවිධ ස්වරූපයන්

පොළොන්නරු සමයේ දේශපාලන සහ ආර්ථික ඉතිහාසය අනුරාධපුර රාජධානී සමයේ මෙන් එකිනෙකින් ව්‍යුක්තව ගෙන සාකච්ඡාවට බඳුන් කළ නොහැක්කේ එකම කාසියක දෙපැත්තක් මෙන් දැඩි සහසම්බන්ධතාවයකින් බැඳී පවතින බැවිනි. එබැවින් මෙකල විදේශ රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතාවයන් විග්‍රහ කිරීමේදී ද වැදගත් වන එක් සුවිශේෂී සාධකයක් වන්නේ වරෙක මිත්‍රශීලීවත් තවත් විටෙක ආක්‍රමණශීලීවත් ක්‍රියාවට නැගුණු විදේශ ප්‍රතිපත්තිය

තත්කාලීන කලාපීය වෙළඳාමත් සමඟ අන්‍යෝන්‍යව බැඳී පැවතීමයි. අනුරාධපුර රාජධානී සමයත් සමඟ සාපේක්ෂව සැළකීමේදී පොළොන්නරු සමයේ ශක්තිමත් පාලනයක් ගොඩනගා ගත් සෑම පාලකයකු විසින්ම විදේශ රටවල් සමඟ තාන්ත්‍රික සබඳතා ආරම්භ කිරීම, වර්ධනය කිරීම, හා දිගුකාලීනව අඛණ්ඩව පවත්වාගෙන යාම මනා පරිචයකින් යුතුව සිදු කරනු ලැබූ බව පෙනී යන අතර එහි කැපී පෙනෙන විශේෂත්වය වන්නේ තියුණු දේශපාලන මෙන්ම ආර්ථික දැක්මක් සහිත වීම, උපායශීලී ඥානයකින් යුතුවීම හා ඍජු බව වැනි උසස් ගුණාංගයන් රැසකින් පෝෂණය වී තිබීමයි.

## 2.1. පළමුවැනි විජයබාහු රජුගේ රාජ්‍ය තාන්ත්‍රික ප්‍රතිපත්තිය සහ දේශපාලන, ආර්ථික බල ස්ථාවරත්වය

අඩ සියවසකටත් වැඩි කාලයක් පැවති චෝළ ආධිපත්‍යයෙන් දිවයින මුදාගත් විජයබාහු රජු නැවත චෝළ විරෝධයක් එල්ල වේයැයි පැවති සැකය නිසාත්, පෙරදිග වාණිජ තරඟය තුළ චෝළයින් ලබා තිබූ ප්‍රධානත්වය නිසාත් චෝළ විරෝධී රාජ්‍ය තාන්ත්‍රික ප්‍රතිපත්තියක් ගොඩනැගීමෙහිලා පියවර ගත් බව පෙනේ. ඔහු මේ සඳහා විදේශ රටවල දේශපාලන තත්ත්වයන් හා වාණිජ කටයුතු පිළිබඳ විචාරාත්මක බුද්ධියෙන් යුතුව ක්‍රියා කරමින් තත් අවධිය වන විට චෝළ අධිරාජ්‍යය සමඟ එදිරිවාදීව සිටි කලාපීය රටවල් සමඟ මිත්‍ර ජාලයක් ගොඩනගා ගැනීමට ක්‍රියා කර ඇත. හෙතෙම අග්නිදිග ආසියාතික බුරුම රාජ්‍ය සමඟ මිත්‍ර සබඳතා වර්ධනය කර ගත්තේ රෝහණයේ පාලකයා වීමත් සමගිනි. මහාවංසය පෙන්වා දෙන පරිදි කිත්ති කුමාරයා බුරුම රජු වෙත පුද පඬුරු සහිත දූතයින් යැවූ බවත් පෙරළා බුරුම රජු මාහැඟි වෙළඳ බඩු පිරවූ නැවු ශ්‍රී ලංකාවට එවූ බවත් දැක්වෙන පුවත මෙහිලා නිදසුනකි (*මව.* LVIII:9-10). මෙසේ මේ වන විට සැළකිය යුතු දේශපාලන බලයක් නොවූ කිත්ති කුමාරයාට රාජ්‍ය තාන්ත්‍රිකව උදවු සැපයීමෙහිලා බුරුම රජු ඉදිරිපත් වූයේ, එක් පසකින් චෝළ ආධිපත්‍යය නිසා අවහිර වී තිබූ ලංකා- බුරුම වාණිජ සබඳතා පුළුල් කර ගැනීම මෙන්ම අනෙක් පසින් ඒ වන විට අධිරාජ්‍යයක් ගොඩනගමින් සාගර වෙළඳාමේ ප්‍රබල සාමාජිකයකු වූ චෝළවරුන්ගේ ශක්තිමත් බලයට විරුද්ධ කලාපීය සන්ධානයක් ගොඩනගා ගැනීම කාලෝචිත වූ බැවිනි.

එමෙන්ම ඔහු චෝළ ආධිපත්‍යයෙන් දිවයින මුදවා ගැනීමෙන් අනතුරුව සිදු කළා වූ විවාහ ප්‍රතිපත්තියේදී ද දේශීය සම්ප්‍රදායානුකූල චාරිත්‍රවලින් ඔබ්බට ගොස් කලාපීය මිත්‍රත්වය ශක්තිමත් කිරීමට උත්සුක වී ඇති බව පෙනී යයි. මෙතෙක් පැවති සමකුල විවාහ ක්‍රමය නැමති දේශීය න්‍යායයෙන් ඔබ්බට ගොස් කලාපීය බල ව්‍යුහයක් ගොඩනගා ගනු වස් විදේශ රාජ්‍යයන් කිහිපයකින් ආවාහ විවාහ සබඳතා ගොඩනගා ගනු ලැබීය. විජයබාහු රජුගේ අගමෙහෙසිය වූ ලීලාවතිය අයෝධ්‍යාවේ (*මව.* LVI:12) ජගතිපාලගේ දියණියකි (*මව.* LIX:24-26). ජගතිපාල යනු චෝළ සෙල්ලිපිවල එන වීරාසලමේගන් බවත් ඔහු කනෞජයෙන් පැමිණියකු බවටත් මතයක් ඇත

(නිකලොස්, 1972:438-461; වෛද්‍යනාථන්, 1972:399). එනිසා ඔහු උතුරු ඉන්දීය සම්බන්ධතාවයක් ද ගොඩනගා ගැනීම කෙරෙහි සැළකිළිමත් වූ බව සිතිය හැකිය. අනතුරුව බෙංගාල බොක්ක කලාපයට මුහුණලා වාණිජමය ලෙස වැදගත් ප්‍රදේශයක් වූ කාලිංගයෙන් තිලෝකසුන්දරී නම් කුමාරිකාවක් ආවාහ කර ගැනීම හරහා එරට සමඟ මිත්‍රත්වය ගොඩනගා ගත්තේය (*මව.* LIX:30-31). ආවාහ විවාහ ප්‍රතිපත්තිය රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පුළුල් කරගැනීම සඳහා යොදාගනු ලැබුවත් ඒ තුළ කැපී පෙනෙන ලක්‍ෂණයක් වූයේ චෝළ රාජ්‍යය බලවත් සතුරෙකු ලෙස හඳුනාගෙන කටයුතු කිරීමයි. චෝළ රජු විජයබාහු රජුගේ නැගණිය වූ මිත්තා කුමරිය ආවාහ කරගැනීම සඳහා යෝජනාවක් ගෙනෙ ආවද එය ප්‍රතික්‍ෂේප කළ ලක් රජු ඇයව පාණ්ඩ්‍ය කුමාරයකුට විවාහකර දීමෙන් පාණ්ඩ්‍ය -ලංකා මිත්‍රත්වය තීව්‍ර කරගැනීමට පියවර ගැනීම මෙහිලා එක් නිදසුනකි (*මව.* LIX:41).

විජයබාහු රජුගේ මෙම ආවාහ - විවාහ ප්‍රතිපත්තිය පිළිබඳ අදහස් දැක්වූ මහාචාර්ය පරණවිතානයන්, රජු විසින් මෙසේ පෙර සිරිත් කඩ කරමින් විදේශ කාන්තාවන් විවාහ කර ගනු ලැබූයේ මෙරට සුදුස්සකු නොසිටි නිසාත්, සහලේ ඥාතිත්වයේ දුර්විපාක සැළකිල්ලට ගත් නිසාත් යැයි අනුමාන කර තිබේ (පරණවිතාන, 1972: 505). එහෙත් චෝළයින් දිවයින අත්පත් කරගැනීමේදී අනුරාධපුර රජ පෙළපත සමූල ඝාතනයක් නොකළ බැවින් එම පෙළපත මුළුමනින්ම විනාශ වී ගිය බවක් අනුමාන කළ හැකි නොවේ. අනෙක් පසින් 'සහලේ ඥාතීත්වය නුසුදුසුය' යන මතවාදය සමාජගත වූයේ විසිවැනි සියවසේ දෙවැනි භාගයේ තරම් මෑත අවධියකදීය. එනිසා තමා ජීවත්ව සිටි අවධියේ පැතිර ගිය අදහස් කතුවරයා මෙහිදී අතීතයට අදාළ කොට ගෙන ඇති බවක් පෙනී යන අතර පළමුවැනි විජයබාහු රජුගේ මෙම පිළිවෙත ඉන් එහා ගිය තාර්කික පදනමක සිට කළ දෙයකැයි නිසැකවම සිතිය හැකිය. තත්කාලීන පාලකයින් පුද්ගලික කාරණාවලින් ඔබ්බට ගිය කලාපීය වාණිජ දේශපාලන ව්‍යුහයත් සමඟ සමාන්තරව ඉදිරියට ගිය බව මින් මනාව පැහැදිළි වේ.


පළමුවැනි විජයබාහු රජුගේ ආවාහ - විවාහ ප්‍රතිපත්තිය දිගු කාලීන වශයෙන් කාලිංග - ලංකා - පාණ්ඩ්‍ය සබඳතා ස්ථිරව ගෙන යාමට හේතු විය. නිදසුන් ලෙස කාලිංග බිසවගෙන් උපන් සුභද්‍රා හා සුමිත්‍රා දියණිවරුන් සිය මලණුවන් වූ උපරාජ වීරබාහුටත් ආදිපාද ජයබාහුටත් පිළිවෙළින් සරණපාවා දීමෙන් (*මව.* LIX:43-44) මේ බැඳීම් තමාගෙන් පසුව ද පැවතීමට අවශ්‍ය පියවර ගත්තේය. එමෙන්ම කාලිංග බිසවගෙන් උපන් රත්නාවලී, ලෝකනාථා නම් අනෙක් දියණිවරුන් තම බෑනාවරුන් වූ (පාණ්ඩ්‍ය කුමරුකුට දාව මිත්තාගෙන් උපන්) මානාභරණ හා කිත්සිරිමේඝ යන කුමාරවරුන්ට සරණපාවා දුන්හ (*මව.* LIX:44). පස්වැනි දියණිය වූ රූපාවතියගේ මරණින් පසු සිය අගබිසව කුසින් උපන් යශෝධරාගේ දියණිය වූ සුගලාවන් සිරිවල්ලභ හට පාවා දීමෙන්

පාණ්ඩ්‍ය ලේ ඥාතීත්වය තව දුරටත් නොනැසී රැක ගත්තා සේම (*මව.* LIX:45-46) පාණ්ඩ්‍ය සහ උතුරු ඉන්දීය සබඳතාවයට ද ස්ථිරසාර පදනමක් දැමීය.

රාජ්‍ය පාලනයේදී සදාචාර ධර්ම ගැන එතරම් අවධානයක් යොමු නොකරන කෞටිල්‍යගේ නිගමනය වී ඇත්තේ රජකුගේ පරම අභිලාශය විය යුත්තේ තම රාජ්‍යයෙහි අභිවෘද්ධිය හා තම රට වැසියන්ගේ සුභසාධනය පමණක්ම යන්න බවය. (ඉලංගසිංහ, 2008:105) විජයබාහු රජුගේ ආවාහ - විවාහ ප්‍රතිපත්තිය සැළකීමේදී ඔහුද සම්ප්‍රදායික දේශීය ඥාති සම්බන්ධය බෙහෙවින් බණ්ඩනය කරමින් සිය අරමුණු කරා ගිය බව පෙනේ. ඔහු පෙර සිරිත් නොතකා සිය දූවරු සිය සහෝදරයින්ට (දුව+බාප්පා) විවාහ කර දී ඇත. තවත් දියණියන් තිදෙනකු සිය බෑනණුවන්ට සරණපාවා දී ඇත. සුගලා - සිරිවල්ලභ විවාහය මිණිපිරිය හා බෑණා අතර විවාහයකි. මෙනිසා පෙර අවධියට සාපේක්ෂව මෙය සුවිශේෂී තත්ත්වයක් බව පැහැදිළි ය. පහත දැක්වෙන සටහන තුළින් විජයබාහු රජු විවාහ ප්‍රතිපත්තිය හුදෙක්ම, කලාපීය වාණිජ රටාවට අන්තර් ග්‍රහණය කළ බව යථාර්ථවත් වෙයි. ඔහුගේ මෙම ක්‍රියාවලිය තුළ චෝළයින් හැර කලාපීය වශයෙන් කිසිම සතුරු රාජ්‍යයක් නොවීය. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් පමණක් නොව සෙසු මිත්‍ර රාජ්‍යයන් සැළකුව ද විවාහ පදනම යටතේ ඒ බොහෝ රාජ්‍යයන් එකිනෙකින් බද්ධ වී පැවති නිසා එකම පවුලක් ලෙස තත් අවධියේ ක්‍රියාත්මක වූ බව පැහැදිලි වේ. මෙවැනි කලාපීය එකමුතු බවක් ගොඩනැගීමේ ප්‍රායෝගික අවශ්‍යතාවය පළමුවරට අවබෝධ වූයේ විජයබාහු රජුට යැයි කීම නිවැරදිය. එය තත් අවධියේ මෙරට පාලකයින්ගේ රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවල සුවිශේෂීත්වය කියාපාන්නකි. මේ හරහා කාලිංගය - ලංකා - පාණ්ඩ්‍ය ආදී බෙංගාල බොක්කට මුහුණලා පිහිටි රාජ්‍යයන් එකිනෙකින් අන්‍යෝන්‍යව බැදෙමින් ඥාති පවුලක් මෙන්ම කලාපීය වාණිජ හවුලක් හෙවත් සංධානයක් ලෙසත් ක්‍රියාත්මක වූ බව පෙන්වා දිය හැකිය.

මෙකී විදේශ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා නොබිඳී පවත්වාගෙන යාමේදී විදේශ බිසෝවරුන්ගේ ඥාතීන්ට ද මෙරට සැළකිය යුතු තනතුරු ලබා දෙමින් එකී මිතුරු බැඳීම් ශක්තිමත් කර ගැනීමට ද උත්සුක වී ඇත. නිදසුනක් ලෙස සිංහපුරයෙන් පැමිණි තිලෝකසුන්දරී කුමරියගේ ඥාතීන් වූ මධුකාර්ණව, භීමරාජ, බලාත්කාර නම් වූ රජ කුමරුවන්ට වැටුප් දී නවතා ගත් බව <u>මහාවංසය</u> අධ්‍යයනය කිරීමෙන් පැහැදිළි වේ (LIX:46-49). ඇතැම් විට කාලිංගය සමඟ වූ වාණිජ ගණුදෙනු ප්‍රවර්ධනය කිරීම මොවුන්ගේ පැමිණීමේ හරය වන්නට ඇත. විජයබාහු රජු සෙසු රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවලට වඩා වැඩි උනන්දුවක් කාලිංගය විෂයයෙහි ලබාදීමේ නිසැක අභිලාෂය වන්නට ඇත්තේ බෙංගාල බොක්ක මහා වෙළෙඳ පොළට මුහුණලා පිහිටි කාලිංගදේශය සමඟ එක්ව වාණිජ ගණුදෙනු ප්‍රවර්ධනය කිරීම යැයි තාර්කිකව උක්ත කරුණු පෙළගැස්වීමේදී පෙනී යයි.

**විජයබාහු රජුගේ ආවාහ - විවාහ ප්‍රතිපත්තිය**




(මහාවංසගත සාක්ෂි ඇසුරිනි)

එමෙන්ම ඔහු අග්නිදිග ආසියාතික රාජ්‍යයන් සමඟ ආරම්භයේ සිටම වර්ධනය කරගත් මිත්‍ර සබඳතා දිවයිනේම පාලකයා වීමෙන් පසුව ද අඛණ්ඩව පවත්වා ගත්තේය. ඔහු රාජ්‍ය පදප්‍රාප්ත වී නොබෝ කලකින් දිවයිනේ බුද්ධ ශාසනය යළි පිහිටුවීමේ කාර්යයේදී රාමඤ්ඤ රට අනුරාධ නම් මිතුරු රජු වෙත පඬුරු සහිත දූතයන් යවා ත්‍රිපිටකයෙහි විශාරද වූ සිල්වත් භික්ෂූන් ගෙන්වා ගත් බව දක්වෙන පුවත එහිලා නිදසුනකි (*මව.* LX:4-7). තත් අවධියේ ඉන්දීය සාගර වාණිජ කටයුතු තුළ සැළකිය යුතු රාජ්‍යයක් ලෙස බුරුමය පැවතීම නිසා ඔවුන් සමඟ දිගුකාලීන මිත්‍රත්වයක් මේ හරහා ගොඩනගා ගන්නට අරමුණු කළ බව පෙනේ. පොළොන්නරුවේ වේලයික්කාර සෙල්ලිපියෙන් ද සනාථ වන මේ පුවත (*EZ*, II:242-256) සැලකිල්ලට ගැනීමේ දී, අනුරාධපුර අවධිය පුරා පැවති ඉන්දීය ආගමික සබැඳියාව වෙනුවට අග්නිදිග ආසියාතික රාජ්‍යයන්ට යොමුවීමක් පොළොන්නරු අවධියේ දැකිය හැකිය. මෙය උපායමාර්ගිකව රාජ්‍යයන් මිත්‍ර ක්රගැනීමේ ක්‍රමවේදයක් බව පෙනේ.

තවද ඔහු දඹදිව සමඟ (උතුරු ඉන්දියාවේ බරණැස, බුද්ධගයා, කනෞජ් වැනි ප්‍රදේශ අදහස් වන්නව ඇත) නොයෙක් සබඳතා අඛණ්ඩව ගෙන ගොස් ඇත. මේ ප්‍රදේශ තත් අවධියේ ප්‍රසිද්ධ වාණිජ නගර ලෙස පැවති බවට සැකයක්

නැත. අනෙක් අතින් බරණැස ගොඩබිම් සේද මාවතට ද සම්බන්ධව තිබූ හෙයින් බෙහෙවින් සශ්‍රීක වෙළදාමක් පැවති බව අනුමාන කළ හැකිය. මහාවංසයේ දැක්වෙන පරිදි විජයබාහු රජු දඹදිවින් ආවා වූ බොහෝ පණ්ඩිතයන්ට විවිධ ධන ධාන්‍යයෙන් ප්‍රදානයන් කළ බවටත් (*මව.* LX:19-20) නොයෙක් වර මාහැඟි මිණිමුතු ආදී රුවන් යවා දඹදිව මහාබෝධිය නමස්කාර කළ බවටත් (*මව.* LX:22-23) දැක්වෙන විස්තර මෙහිලා නිදසුන් සපයයි. මෙකල සිදු වූ මෙවැනි ආගන්තුක සත්කාර හෝ ආගමික ප්‍රදානයන්ගේ එක් අරමුණක් වූයේ වාණිජ සබඳතා මුවහත් කර ගැනීමයි. මේ අනුව විවිධ ක්‍රමෝපායයන් හරහා පළමුවැනි විජයබාහු රජු ශක්තිමත්, රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ගොඩනගාගෙන ඒවා දිගු කාලීනව පවත්වා ගැනීමට සමත් වූ බව පෙනීයයි. එහෙත් ඔහුගේ ඇවෑමෙන් පසු මේ තත්ත්වයන් බෙහෙවින් වෙනස් විය. අභ්‍යන්තර දේශපාලන බල අරගල හේතුවෙන් විදේශ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පරාක්‍රමබාහු රාජ්‍යෝදය දක්වාම යම්කිසි බිඳවැටීමකට ලක් වී පැවති බව පෙනේ.

## 2.2 මහා පරාක්‍රමබාහු රජුගේ විදේශ ප්‍රතිපත්තිය

පළමුවැනි පරාක්‍රමබාහු රාජ්‍යෝදය සමයේදී විදේශ රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවල ස්වරූපය පූර්ව පාලකයින්ට සාපේක්ෂව වෙනස්ම දිසානතියක් පිළිබිඹු කළ බව පෙනේ. ඔහු දක්ඛිණ දේශාධිපතිව සිටි සමයේම සිය පවුලේ කුමාරයන්ට හා කුලවතුන්ගේ පුතුන් ආදීන් රජ මැදුරේ තබා ගනිමින් නොයෙක් යුද්ධායුධ පුහුණු මෙන්ම විදේශ භාෂා දැනුම ද ලබා දුන් බව කියැවේ. “ඇත්, අස්, කඩු, ශිල්පයෙහි ද අන්‍ය දේශ භාෂයෙහි ද..... දක්ෂව රාජකාර්යයෙහි නුවණැතිව වැඩෙත්වා”යි (*මව.* LXIX:23-24) යනුවෙන් සඳහන් වීමෙන් පැහැදිලි වන්නේ, සිය සමීපතමයින්ට විදේශ භාෂා පුහුණුව ලබාදීමෙන් තානාපතීන් ලෙස පත්කර ගැනීම හා වෙළෙඳ ශ්‍රේණි හා විදේශ වෙළෙන්දන් සමග ගණුදෙනු කරන භාෂා පරිවර්තකයින් ලෙස පත් කිරීම අරමුණ වූ බවයි. එමෙන්ම ක්‍රි.ව. 1154 පමණ දී අල්-ඉද්රිසි ලංකාවේ රජු ගැන දක්වන විස්තරයේදී, ඔහුට අමාත්‍යවරුන් දහසය දෙනෙකු සිටි බවත් ඔවුන් අතුරින් සිවු දෙනෙකු බෞද්ධයින්ද, සිවු දෙනෙකු ක්‍රිස්තු භක්තිකයින්ද, සිවු දෙනෙකු මුස්ලිම්වරුන්ද, සිවුදෙනකු යුදෙව්වරුවන්ද'' වූ බව පෙන්වා දී තිබේ (ඉමාම්, 1962:57; Dewaraja, 2003:184). මින් පෙනී යන්නේ ආගමික හා භාෂා සංරෝධක ඔහු සාර්ථක ලෙස කළමනාකරනය කරගනිමින් යුදෙව්, මුස්ලිම් හා බටහිර රටවල් සමඟ රාජ්‍ය තාන්ත්‍රිකව ගනුදෙනු කර ඇති බවයි. රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවලදී මිත්‍ර සබඳතා යම්තාක් දුරකට යොදාගනු ලැබූව ද මිත්‍ර පදනම මතම නොසිට ඉන්දීය සාගර වාණිජ රටාවට අනුකූල ලෙස උපායශීලී පිළිවෙතක් මෙහිදී අනුගමනය කර තිබේ. ඔහුගේ අවධියේ මෙම සබඳතා ඍජුවම අර්ථ ක්‍රමයේ උන්නතිය සඳහාත් දේශපාලනමය බල තුලනය සඳහාත් යොදාගෙන තිබුණි. ඔහු පෙර පාලකයින් මෙන්ම රාජ්‍ය තාන්ත්‍රික සබඳතා සුහඳශීලීව ගෙන ගියත් තමාට අභියෝගයක් වන ඕනෑම රාජ්‍යයකට එරෙහිව නැගී සිටීමට පසුබට

නොවීය. මෙතෙක් රාජ්‍ය තාන්ත්‍රිකව ශ්‍රී ලංකාවේ මිත්‍ර රාජ්‍යක්ව සිටි බුරුමයට විරුද්ධව, වාණිජ කරුණක් මත ගැටුම් ඇති කර ගැනීම එහිලා එක් නිදසුනකි (*මව.* LXXVI:43-66 ; *EZ,* III:321). එම අරගලයට හේතු දක්වෙන වංසකථාගත සාක්ෂි විමර්ශනය කිරීමේදී පළමුවැනි පරාක්‍රමබාහු රජු හා කාම්බෝජය අතර පැවති රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවක් හෙළිදරව් වේ. එහි දක්වෙන පුවත් අනුව රන්පත් ඉරුවක් සමඟ කාම්බෝජය වෙත දූතයින් යැවීමක් ගැනත්, සිංහල කුමාරිකාවක් කාම්බෝජය වෙත යැවීමක් පිළිබඳවත් ඉඟියක් ලබාදෙයි (*මව.* LXXVI:21-22). මහාචාර්ය රෝහණදීරයන් පෙන්වා දෙන පරිදි වංසකථාවේ ''රාජකඤ්ඤං'' යනුවෙන් සඳහන් වන්නේ අවිවාහක රාජ කුමාරිකාව යන්න හෙයින් ඇය දූත පිරිසක් සමඟ කාම්බෝජයට යවන ලද්දේ විවාහ සබඳතාවක් සඳහා විය යුතුය (රෝහණදීර, 2000:412). ඇය පළමුවැනි පරාක්‍රමබාහු රජුගේ දියණියක වූ සුභද්දා කුමරිය බවට පෙන්වා දෙන අදහස (රෝහණදීර, 2000:412) නිවැරදි නම් පරාක්‍රමබාහු රජු සිය රාජ්‍ය තාන්ත්‍රික සබඳතා සඳහා ආවාහ විවාහ ප්‍රතිපත්තිය යොදාගෙන තිබෙන බව තහවුරු වේ.

මෙසේ දේශපාලන විරසක භාවයක් උද්ගතව පැවතියත් දෙරට අතර වූ ආගමික බැඳීම නොවෙනස්ව පැවතුණු බව යුද්ධ අවසානයේ අරමණ වාසීන් ශ්‍රී ලංකාවේ සංඝයා වහන්සේලාට පළමුවැනි පරාක්‍රමබාහු රජු සමඟ සමාදානයක් ඇතිකර ගැනීමට ඇරයුම් කිරීමෙන් පැහැදිලි වේ (කිරිබමුණේ, 1966-67:205). එමෙන්ම මින් පසු බුරුමයේ 'සීහල සංඝ' නම් නිකායක් ඇතිවීම, උත්තරජීව, චපට වැනි භික්ෂූන් මෙරටට පැමිණ ආගමික අධ්‍යාපනය ලැබීමත් මේවා බුරුම - ලංකා සමගි සම්මුතියට සමාසන්න වූ සිදුවීම් වීමත් නිසා දෙරට අතර ආගමික මිත්‍රත්වය කඩ නොවූ බව පැහැදිලි වේ (කිරිබමුණේ, 1966-67:205).

පරාක්‍රමබාහු රජු තම රාජ්‍ය කාලයෙන් වැඩි කාලසීමාවක් මිඩංගු කළ දකුණු ඉන්දීය අරගලය සැළකුව ද ඔහු අවස්ථාවෝචිතව වරෙක පාණ්ඩ්‍යයන්ටත්, වරෙක චෝළයින්ටත් ලෙස යුධ ආධාර ලබා දෙමින් දෙබිඩි ස්වරූපයේ රාජ්‍යතාන්ත්‍රික සබඳතාවක් ගෙනගොස් ඇති බව හෙළිවේ (මව. 2004:LXXVI, LXXVII). එම අරගලය හා අරමණ යුද්ධය සැලකූ විට පැහැදිලිව පෙනී යන්නේ දේශපාලනය තුළ සදාකාලික මිතුරන් හෝ සතුරන් නොසිටී යන ඉන්දීය න්‍යායාචාර්යවරුන් පෙන්වා දී ඇති කියමනයි. ඉන්දීය න්‍යායග්‍රන්ථ ඇසුරු කළ බව පෙනෙන පළමුවැනි පරාක්‍රමබාහු රජු තම ආර්ථික අරමුණුවලට ප්‍රමුඛත්වය දෙමින් වරෙක මිත්‍රශීලීව මෙන්ම අවශ්‍ය අවස්ථාවන්හි ආක්‍රමණශීලීත් විදේශ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැගීමට පසුබට වී නැත. ඔහු විවාහ ප්‍රතිපත්තිය හරහා රටවල් දිනාගත් බවක් වංසකථාවලින් හෙළි නොවේ. ඔහුගේ අගබිසව වූ ලීලාවතිය පාණ්ඩ්‍ය වංශික ඥාතීත්වයක් ඇති කුමාරිකාවක් (කිරිබමුණේ, 1972:491-492) බව හෙළි වුවත් අනෙකුත් බිසෝවරුන් වූ රූපාවතිය, චන්ද්‍රවතිය, (*මව.* LXXIII:139-149; *EZ,* II:240-241) ක්ෂත්‍රිය වංශික යැයි දක්වතත් කවර රටක කුමාරිකාවන් දැයි පැහැදිලි නැත. තම අනුප්‍රාප්තිකයා ලෙස එවකට කාලිංගයේ විසූ තම සොහොයුරියකගේ පුත්‍රයකු වූ (සිය බෑණා වූ) දෙවැනි

විජයබාහු නම් කළ බව පොළොන්නරුව පුවරු ලිපියෙන් (*EZ*, II:182) හෙළිවීමෙන් පැහැදිළි වන්නේ ඔහු ද සිය එක් සොහොයුරියක් කාලිංග කුමාරයකුට සරණපාවා දී ඇති බවයි. එබැවින් පළමුවැනි විජයබාහු මෙන්ම පළමුවැනි පරාක්‍රමබාහු ද සිය රාජ්‍ය තාන්ත්‍රික සබඳතා කාලිංගය සමඟ අඛණ්ඩව පවත්වාගෙන ගොස් ඇති බවක් මෙමගින් තහවුරු වෙයි.

අනතුරුව බලයට පැමිණි දෙවැනි විජයබාහු රජු ද පෙර රජුන් දවස බිඳී ගිය මිත්‍රත්වය යළි තහවුරු කර ගැනීමට කටයුතු යෙදූ බව පෙනේ. ඔහු විසින් මාගධී භාෂාවෙන් අරිමද්දන රජුට ලිපියක් යැවූ පුවතින් ඒ බව සනාථ වේ (*මව*. LXXX:7-9). ඒ හැර දෙරට අතර රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා පිළිබඳ පුළුල් සාක්ෂි හමු නොවේ. පසුව උදාවන නිශ්ශංකමල්ල රජු අවධියේත් රාමඤ්ඤ දේශය සමඟත්, කර්ණාට, නෙල්ලූර්, ගෞඩ (බෙංගාලය), කාලිංග, ආන්‍ද්‍ර, ගුජරාට් සහ කාම්බෝජ යන රටවල් සමඟත් මිත්‍ර සබඳතා ගෙන ගිය බව දක්වා තිබේ (*EZ*, II:107). ඔහුගේ රාමේශ්වරම් සෙල්ලිපියෙන් අනාවරණය වන පරිදි (කිරිබමුණේ, 1972:497) ආගමික සම්බන්ධතා ද මේ සඳහා යොදාගෙන තිබෙන බව පෙනේ. ඊට අනුව රජු දකුණු ඉන්දියාවේ රාමේෂ්වරම්හි දේවාලයක් ප්‍රතිසංස්කරණය කරවා නිශ්ශංකේශ්වර යනුවෙන් නම් කළ බව තමා හිඳගත් ගල් ආසනයේ කොටවා තිබේ. චෝළයින් වෙල්ගම් වෙහෙරට කළ ප්‍රදානයන් මෙන්ම මේ තුළද බහු අරමුණු වූ බව අනුමාන කළ හැකි වේ.

එසේම නිශ්ශංකමල්ල රජු සිය රාජ්‍යතාන්ත්‍රික සබඳතා සඳහා විවාහ ප්‍රතිපත්තිය ද යොදවා ගත්හ. ඔහුගේ සෙල්ලිපි සාධක අනුව කාලිංග, වෙංගි, කර්ණාට, නෙල්ලූර් හා ගුජරාට් යන රාජ්‍ය සමඟ විවාහ සබඳතා ඇති කර ගත්තේය (*EZ*, II:289). ඔහුගේ දෙවැනි බිසව වූ කළ්‍යාණවතිය ගංග වංසයට අයත් කාලිංග සබඳතාවක් හිමි තැනැත්තියකි (කිරිබමුණේ, 1972:493). එබැවින් පොළොන්නරු පාලකයින් බොහොමයක් කාලිංගය සමීපතම රාජ්‍ය තාන්ත්‍රිකයා බවට පත් කරගෙන ඇති බව පෙනේ. එමෙන්ම ඔහු කාම්බෝජය සමඟ ද මිත්‍රත්වයෙන් විසූ බව රුවන්වැලි සෑ මළුවේ පිහිටි සෙල්ලිපියෙහි සඳහන් කරුණුවලින් පැහැදිළි වේ (*EZ*, II:70-83). එහි එන කරුණු අනුව 'කාම්බෝදී' නමින් සඳහන් කළ පක්ෂීන් අල්ලන පිරිසකට එම පවුකාර වෘත්තියෙන් ඉවත්වන ලෙස ඉල්ලීමක් කළ බවත් ඔවුන් සතුටු වන අන්දමට රන්, රුවන්, රෙදි ඇතුළු කැමති වස්තුවක් දුන් බවත් කියැවේ (*EZ*, II:78). එමෙන්ම දොළොස්වැනි සියවසේ පොළොන්නරුවේ එක් නගරද්වාරයක් කාම්බෝජ වාසල ලෙස හඳුන්වා තිබීම (කිරිබමුණේ, 1966-67:208) නගරයේ එකී දිසාවේ කාම්බෝජ වාසස්ථාන පැවති බවට සාක්ෂි සපයයි. එබැවින් තත් අවධියේ මෙම වැසියන්ට රාජ්‍යමය අනුග්‍රහය හා අවධානය ඍජුව ලැබුණු බව පැහැදිළි වේ. මේ අනුව පොළොන්නරු පාලකයින් රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා ධනාත්මක ලෙස පවත්වාගෙන යාමේදී විවිධ ක්‍රමෝපායයන් අනුගමනය කර ඇති බවත් ඒ සියල්ල මෙරට ආර්ථික ක්ෂේත්‍රයට හානිදායක

නොවන ලෙස කළමනාකරණය කර ගැනීමටත් මහත් දක්ෂතා දක්වා ඇති බව සනාථ වේ.

### 3. විදේශ ප්‍රතිපත්තිය සහ ආක්‍රමණශීලී ක්‍රියාමාර්ග

"වෙළඳාමේ සංවිධානය සැළකිය යුතු තරම් දුරකට පවත්නා බල තුලනයේ පිළිබිඹුවක් වූ හෙයින් වෙළඳාම ගැටුම් හා යුද්ධ සඳහා විභවයන් ඇති කළේය"(ගුණවර්ධන, 2000:640). ආක්‍රමණ රැසකින් පිරී පැවති පොළොන්නරු අවධියේ රාජ්‍ය පාලකයින්ගේ විදේශ ප්‍රතිපත්තිය ඒ සඳහා කදිම නිදසුන් ලබා දෙයි. අනුරාධපුර අවධිය සැළකිල්ලට ගැනීමේදී දේවානම්පියතිස්ස අවධියේ සිට පස්වැනි මිහිඳු දක්වා පාලකයින්ගේ උක්ත භූමිකාව බෙහෙවින් සාමකාමී හා මිත්‍රශීලී පදනමකින් සිදු කළ බව වංසකථා (*මව.* :XI:19-24; XXIX:29-43) හා සෙල්ලිපි ප්‍රධාන පුරාවිද්‍යාත්මක මූලාශ්‍රවලින් ද සනාථ වේ. තත් අවධිය තුළ දිවයිනට විදේශ ආක්‍රමණ එල්ල වූ කල්හි එයින් දිවයින මුදවා ගෙන පූර්ව චාරිත්‍ර පරිදි රට ගෙනයෑම මිස දේශීය පාලකයින් විසින් විදේශවලට තර්ජන සිදු කළ බවට සාක්ෂි හමු නොවේ. මෙම පිළිවෙතින් ඔබ්බට ගිය එකම අවස්ථාව වන්නේ පළමුවැනි ගජබාහු අවධියේ සිදුවුණා යැයි පැවසෙන දකුණු ඉන්දීය ආක්‍රමණය පමණි (ශාස්ත්‍රී, 1964:178-179). 'අංකොට හටන', 'ගජබා කථාව' ආදී ජනකථාවලින් හෙළි වන පරිදි ඔහු දකුණු ඉන්දියාව ආක්‍රමණය කොට චෝල රජු බිය වද්දා වංකනාසික තිස්ස රජ දවස මෙරටින් ගෙන ගිය සිහලුන් හා දොළොස් දහසක් දමිලයින් මෙරටට රැගෙන ආ බව කියැවේ (ශාස්ත්‍රී, 1964:178-179). එහෙත් එම සිද්ධිය මෙරට කිසිදු වංසකථාවකින් හෙළි නොවන, ජනකථා සාහිත්‍යයට සීමා වූ කථා පුවතක් හෙයින් ඓතිහාසික වටිනාකමක් නිශ්චිතව තහවුරු කරගැනීම දුෂ්කර වී තිබේ. එනිසා පොදුවේ ගත්කල පූර්ව පොළොන්නරු අවධියේ සුහදශීලී විදේශ ප්‍රතිපත්තියක් පැවති යැයි පිළිගැනීම නිවැරදි වේ.

එහෙත් චෝල ආධිපත්‍යයෙන් නිදහස ලැබූ දේශීය පාලකයින් පොළොන්නරුව කේන්ද්‍ර කර ගනිමින් රාජ්‍ය පාලන න්‍යාය ක්‍රියාත්මක කිරීමේදී පූර්ව ආදර්ශයන් මත පිහිටා ක්‍රියා කළත් තම රාජ්‍යයට අභියෝගයක් වූ හා අභියෝගයක් ලෙස දුනුණු සෑම රාජ්‍යයක් කෙරෙහිම ආක්‍රමණශීලී විදේශ ප්‍රතිපත්තියක් ක්‍රියාගත කිරීමට මැලි නොවීය. මෙකල පාලකයාගේ ඍජු අධීක්ෂණයෙන් සිදු වූ විදේශ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවූ ප්‍රධාන නිලධාරී පිරිස වූයේ දූත මණ්ඩල හෙවත් තානාපතීන්ය. අන්තර් රාජ්‍ය සම්මතය අනුව දූතයාගේ කාර්ය ස්වාමියාගේ අණ ක්‍රියාත්මක කිරීම බැවින් ඔහු වරදක් කළා වුවත් ඔහුට දඬුවම් කළ නොහැකිය (ඉලංගසිංහ, 2008:113). මෙම භාරතීය න්‍යාය පොළොන්නරු පාලකයෝ ද ක්‍රියාවට නැංවූහ. යම් රාජ්‍යයක් එකී න්‍යාය බණ්ඩනය කළහොත් ඊට විරුද්ධව දැඩි ක්‍රියාමාර්ග ගන්නා ලදී. මෙහිලා කදිම නිදසුනක් පළමුවැනි විජයබාහු රාජ්‍ය අවධියෙන් හඳුනාගත හැකි වේ. යට දක්වන ලද පරිදි විජයබාහු රජු පාණ්ඩ්‍ය,

කර්ණාටක, කාලිංග, කනෞජය හා බුරුමය වැනි රාජ්‍යයන් සමඟ සුහඳශීලී විදේශ ප්‍රතිපත්තියක් ගෙන ගියත් චෝළ රාජ්‍යය සම්බන්ධයෙන් ආක්‍රමණශීලී ක්‍රියාමාර්ගයන් ගන්නා ලදී. ස්වකීය රාජ්‍ය පද ප්‍රාප්තියෙන් පසු තමා හමුවට පැමිණි විදේශ තානාපතීන් අතරින් චාලුක්‍ය දූතයින් ප්‍රථමයෙන් පිළිගනු ලැබූ අතර චෝළ මණ්ඩලයෙන් පැමිණි දූතයින්ට ප්‍රමුඛතාවයක් ලැබුණු බවක් නොපෙනේ (*මව.* LX:26-27). සාර පඬුරු දී පළමුව කර්ණාටක දූතයින් සමඟ ශ්‍රී ලංකාවේ දූතයින් පෙරළා යැවූ අතර ඔවුනට චෝළ දේශයේදී හිරිහැර සිදුවීම විජයබාහු රජු කෝප කරවීමට හේතුවක් විය. මේ වන විටත් තමා හමුවට පැමිණි සිටි ද්‍රවිඩ දූතයින්ට ස්ත්‍රී අභරණ පැළඳවීමෙන් තම දැඩි අප්‍රසාදය දන්වා යවා චෝළ රජුට රිසි පරිද්දෙන් යුද්ධයකට ඇරයුම් කිරීමත්, අනතුරුව මැටිවල් තොටට සේනා සංවිධානය කිරීම (*මව.* LX:30-33) තුළිනුත් ඔහුගේ ආක්‍රමණශීලී විදේශ ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කරයි. මේ වන විට මෙරට සේවයේ නියුතු දමිළ සේනාවන් ඊට විරුද්ධව කළහකාරී ලෙස හැසිරෙමින් පොළොන්නරුව කොල්ලකා රජ මාළිගා ගිණි තබා, රජ පවුලේ පිරිස් අත්අඩංගුවට ගැනීමේ සිද්ධියත් සමඟ (*මව.* LX:34-39) විජයබාහු රජුගේ ආක්‍රමණය අසාර්ථක වුවත් මෙකී සිද්ධිය තත් අවධියේ දේශීය පාලකයින්ගේ බල වර්ධනය, අභියෝගාත්මක බව, ආක්‍රමණශීලී ප්‍රතිපත්ති මොනවට පැහැදිලි කරන අවස්ථාවකි.

මින් අනතුරුව පැහැදිලි විදේශ ප්‍රතිපත්තියක් පිළිබඳ තොරතුරු හමුවන්නේ පළමුවැනි පරාක්‍රමබාහු රජු අවධියේය. පොළොන්නරු පාලකයින් අතරින් දැඩි විදේශ ප්‍රතිපත්තියක් ගෙන ගිය ප්‍රබලම පාලකයා ඔහුය. දේශීය වශයෙන් ද දැඩි ක්‍රියාමාර්ග හරහා ත්‍රිසිංහලාධීශ්වර වශයෙන් ඝන්ධීය පාලන ක්‍රමයක් ගෙනගිය ඔහු සිය දේශපාලන හෝ ආර්ථික බලයට එරෙහිව නැගී ආ ඕනෑම පාරසමුද්‍රිත රාජ්‍යයකට විරුද්ධව ආක්‍රමණශීලී පිළිවෙතක් අනුගමනය කරනු ලැබීය. මෙහිලා එක් උදාහරණයක් ලෙස බුරුම ආක්‍රමණය පෙන්වා දිය හැකිය. අඛණ්ඩ මහාවංසයේ මේ පිළිබඳ දීර්ඝ විස්තරයක් දැක්වෙන අතර (*මව.* LXXVI:14-76) බුරුම වංසකථාවල ඒ පිළිබඳ ප්‍රමාණවත් තොරතුරක් නොදැක්වෙයි (කිරිබමුණේ, 1966-67:196). එබැවින් මෙම යුද්ධය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් කළ නොහැකි වුවත් දේශීය වංසකථාගත පුවත මුළුමනින්ම අසත්‍යයක් නොවන බව පෙනෙන්නේ ඊට සම්බන්ධ විශ්වසනීය සාධකයක් දෙවනගල සෙල්ලිපියෙන් ලැබී තිබෙන බැවින් (*EZ,* III:321) හා ගැටළු කාරීත්වයන් හමුවේ වුවත් යම් යම් සුළු දත්තයන් බුරුම වංසකථාවලින් ද ලබා දෙන බැවිනි (කිරිබමුණේ, 1966-67:200-204). පරාක්‍රමබාහුගේ මෙම ආක්‍රමණශීලී විදේශ පිළිවෙතට හේතු වී තිබෙන්නේ දීර්ඝ කාලයක සිට ගිවිසුම් ප්‍රකාරව පවත්වාගෙන ආ ඇතුන් වෙළෙදාමේ චාරිත්‍රයන් බුරුම රජු විසින් උල්ලංඝනය කිරීම හා නොදන්වා සංශෝධනය කිරීමත්, දූතයින්ට හිරිහැර කරමින් දූත මණ්ඩල පිළිබඳ අන්තර් රාජ්‍ය සම්මතයන් කඩ කිරීම, දකුණු බුරුමයේ වරායන්හි වෙළෙඳ බාධක හා කාම්බෝජ - ලංකා සබඳතාවලට

අකුල් හෙළීම වැනි තත්ත්වයන් බව ඉතා කෙටියෙන් පෙන්වා දිය හැකිය (*මව.* LXXVI:14-35; නිකොලස්, 1972:449-451; කිරිබමුණේ, 1966-67:194-204).

මෙම යුද්ධය පිළිබඳ බොහෝ විචාරක මතවාදය වී ඇත්තේ ඒ පිළිබඳ මහාවංස විස්තර ඒකපාර්ශවීය එමෙන්ම අතිශයෝක්තියෙන් පිරි එකක් බවත් (කිරිබමුණේ, 1972:498) අරමණ රට යනු මුළු බුරුම රාජ්‍යයම නොව පේගුරට පමණක් බව හා එය හුදු තර්ජනයක් පමණක් බවත්ය (නිකලොස්, 1972:449). මේ කරුණු සියල්ල ප්‍රතික්ෂේප කළ නොහැකි මුත් උක්ත සඳහන් කරන ලද දෙවනගල සෙල්ලිපිය ප්‍රකාරව කිසියම් තර්ජනාත්මක බලපෑමක් ලක්දිව පාලකයා බුරුම පාලකයා හෝ සිද්ධියට සම්බන්ධ ප්‍රාදේශීය පාලකයාට සිදුකර ඇති බව පිළිගත යුතු වේ. එසේම මෙහිදී වැදගත් කරුණක් වන්නේ, දූත මණ්ඩලවලට හිරිහැර කිරීම සපුරා තහනම් මෙන්ම රාජ්‍ය අතර මතභේද ඇතිවීමට හේතුවක් ලෙස පරාක්‍රමබාහු අවධිය වන විටත් සම්ප්‍රදායක්ව පැවති බවයි. අනෙක් අතින් මෙම ආක්‍රමණයේ හේතු සහ ඒ සඳහා ප්‍රධාන සෙන්පති ලෙස ආදිච්ච දමිළාධිකාරී නම් වූ ගණකාමච්ච (භාණ්ඩාගාරයේ ප්‍රධාන නිලධාරියෙකි) යොදවා තිබීමෙන් (*මව.* LXXVI:39) ඍජුවම මෙය වාණිජ කටයුත්තක් මුල් කර ගත් සිද්ධියක් බව තහවුරු වෙයි. එනම් දෙරට අතර මෙතෙක් ගිවිසුම් ප්‍රකාරව පැවති මූල්‍යමය ගනුදෙනු අනපේක්ෂිත ලෙස කණ්ඩනය වීමේදී ඒ පිළිබඳ මැනවින් දන්නා විෂය භාර ඇමතියාව යෙදවීමට රජු කටයුතු කොට ඇති බවත් මෙමඟින් පැහැදිළි වේ. එනිසා තත් අවධියේ දේශීය රජුන් සිය විදේශ ප්‍රතිපත්තිය තුළදී අන්තර්ජාතික වෙළඳාම කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කළ බව විසද වේ.

ආක්‍රමණ රුසකින් සැදුම් ලත් පළමුවැනි පරාක්‍රබාහු රජුගේ විදේශ ප්‍රතිපත්තියේ යථාර්ථය ග්‍රහණය කරගත හැකි මීළඟ වැදගත්ම අවස්ථාව පාණ්ඩ්‍ය දේශය ආක්‍රමණය කිරීමයි. අඛණ්ඩ මහාවංසයේ මේ යුද්ධයේ ප්‍රථම අදියර පිළිබඳ දීර්ඝ විස්තරයක් ඉදිරිපත් කර ඇත (*මව.* LXXVI: LXXVII). මෙම විස්තරවලට අනුව ක්‍රි.ව. 1169 දී හෝ ඊට ආසන්න කාලයකදී පාණ්ඩ්‍ය දේශයේ සිංහාසන උරුමය සඳහා වූ අභ්‍යන්තර අරගලයකට ආධාර සැපයීමක්, ශ්‍රී ලංකාව මීට මැදිවීමට හේතුව වී ඇත. එවකට පාණ්ඩ්‍ය පාලකයාව සිටි පරාක්‍රමපාණ්ඩ්‍ය ලක් රජුගෙන් යුධ ආධාර ඉල්ලා ඇති අතර ප්‍රතිපාක්ෂිකයා වූ කුලසේකර පාණ්ඩ්‍ය ආසන්නතම රාජ්‍ය වූ චෝළ රජුගෙන් උදව් ඉල්ලා තිබේ. එම යුද්ධයට ආධාර සැපයීම තුළින් පළමුවැනි පරාක්‍රමබාහු අවධිය තුළ යටපත් වී තිබූ චෝළ විරෝධී විදේශ ප්‍රතිපත්තියට නව පුනර්ජීවයක් ලැබුණි.

මෙම යුධ ප්‍රයානයේ ස්වරූපය පිළිබඳ වංසකථාගත පුළුල් තොරතුරු මේ වන විට ශාස්ත්‍රඥයින් කිහිප දෙනෙකු විසින්ම විමර්ශනයට ලක්කර ඇති බැවින් (Sasthre, 1955:350-380; නිකොලස්, 1972:451-460; වෛද්‍යනාථන්, 1972:470-476) මෙහි දී ඊට සම්බන්ධිත පරාක්‍රමබාහු රජුගේ විදේශ ප්‍රතිපත්තියේ ප්‍රායෝගික යථාර්ථය පිළිබඳ පමණක් අවධානය යොමු කෙරේ. පුරාතනයේ

සිට වර්තමානය දක්වාම ලොව බොහෝ රටවල විදේශ ප්‍රතිපත්තීන්හි දැකිය හැකි ප්‍රධාන ලක්ෂණයන් වන්නේ දේශපාලන ආධිපත්‍යය පෙන්වීම, උන්නතිකාමය, ආර්ථික වර්ධනය හා ස්ථාවරතාවය, උනුන් පරයා නැගී සිටීම වැනි අංගයන්ය. මෙකී ප්‍රතිපත්තීන් හි ප්‍රායෝගික ස්වරූපයේ සනාතනික න්‍යායික පදනම වූයේ ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, උනුන් පරයා කැපී පෙනීමේ ආශාව, වැනි දුර්ගුණ මෙන්ම දුබලයාට අනුකම්පා කිරීම, අනුග්‍රහ කිරීම, දුබලයා සතුරන්ගෙන් රැක ගැනීමේ චේතනාව වැනි සද්ගුණ ද වේ (ඉලංගසිංහ, 2008:115). මේ කරුණු සියල්ල පරාක්‍රමබාහුගේ විදේශ ප්‍රතිපත්තිය තුළට අන්තර්ග්‍රහණය කළ නොහැකි වුවත් බොහෝ කරුණු මේ හා සමපාත වන බව පෙනේ. මෙම යුද්ධයට මැදිහත් වීමෙන් දෙපක්ෂයෙන් එක් පක්ෂයකටවත් යහපතක් සිදු නොවූ බව ඇතැමුන් පෙන්වා දී තිබුණද (නිකොලස්, 1972:451) පරාක්‍රමබාහු රාජ්‍ය අවධියෙන් සැළකිය යුතු කාලයක් මිඩංගු කළ මෙම මැදිහත්වීම විග්‍රහ කළ යුත්තේ එකළ පැවති තරඟකාරී ඉන්දීය සාගර වෙළඳාමට අනුරූපීව බව අවධාරණය කළ යුතුය.

මෙම පාණ්ඩ්‍ය අරගලයට ආධාර කළ චෝළ රජුන් වූයේ දෙවැනි රාජරාජ (1150-1176) හා දෙවැනි රාජාධිරාජ රජුයි. තත් අවධියේ චෝළ බලය පෙර අවධීන්ට සාපේක්ෂව යම් බිඳවැටීමක් තිබුණ ද ඔවුන්ගේ සාගර වෙළෙඳ කටයුතුවලට මැදිහත්වීමේ ප්‍රතිශතය අවප්‍රමාණව නොතිබුණි. පරාක්‍රමබාහු රජුගේ 'නයිනතිව්' අභිලේඛනයෙන් සනාථවන කරුණු අනුව එවකට භාණ්ඩ පුරවන ලද නැව් පැමිණෙන ශ්‍රී ලංකාවේ උතුරු වරායන් බද කලාපයේ දී සාගර වෙළෙඳුන්ට ආරක්ෂාව ලබා දිය යුතු බවත්, මුහුදුබත් වන නැව්වලට ගත යුතු පියවර ගැනත් හෙළිදරව් වේ (Indrapala, 1963:63-70). මේ අනුව එම කලාපය තුළදී කිසියම් තර්ජනයක් මේ විදේශ වෙළඳුන් සඳහා තිබී ඇති බවට අනුමානයක් සපයයි. ස්ථානීය පිහිටීම අනුව ඌරාතුරෙයි වරාය (නයිනතිව් හෙවත් වර්තමාන කයිට්ස්) චෝළ මණ්ඩලයට ඉතාම ආසන්න වූ අතර එහි සශ්‍රීක වාණිජ කටයුතුවලට චෝළ රජුගෙන් බාධා එල්ලවන්නට ද ඇත. එහෙයින් චෝළ දේශය දේශපාලනමය ලෙස නිදහස්ව තිබීම පරාක්‍රමබාහුට සිය වාණිජ ස්වාධීනත්වයට තර්ජනයක් වූ අතර අනෙක් පසින් මිත්‍ර පාණ්ඩ්‍ය රාජ්‍ය නිදහස් වීම එම උතුරු කලාපයේ වාණිජ කටයුතු නිදහස්ව සිදුකර ගැනීමෙහිලා යහපත් ලෙස බලපාන්නකි. පළමුවැනි පරාක්‍රමබාහු රජු දකුණු ඉන්දියාව ආක්‍රමණය සඳහා ඌරාතුරෙයි වරායේ නෞකා තැනවූ බවත් හමුදාංක ඒකරාශී කරන ලද බවත් ක්‍රි.ව. 1178 වර්ෂයට අයත් දකුණු ඉන්දියානු සෙල්ලිපියකින් අනාවරණය වීම නිසා (සිරිවීර, 2001:298) තත් ප්‍රදේශය ඉහළ වටිනාකමක් සහිත කර්මාන්ත පුරයක්, වාණිජ මධ්‍යස්ථානයක් ලෙස පැවති බව පෙනී යයි. එබැවින් ඒ ප්‍රදේශයේ වාණිජ ප්‍රවර්ධනය සුරක්ෂිත කිරීමට නම් ආසන්න රාජ්‍යයේ දේශපාලන තත්ත්වයන් පරාක්‍රමබාහු රජුට අත්‍යවශ්‍යයෙන්ම වැදගත් වන්නේය.

ඔහු පාණ්ඩ්‍ය ඔටුන්න හිමි කුමාරයාට උපකාර කරනු ලැබූයේ චිරාත් කාලීන පාණ්ඩ්‍ය-ලංකා රාජ්‍ය තාන්ත්‍රික සබඳතා රැකීමේ හුදු අභිලාෂයෙන් පමණක් නොවේ. මන්ද මෙය පාණ්ඩ්‍ය දේශයේ අභ්‍යන්තර ගැටුමක් නිසා දෙපක්ෂයම පාණ්ඩ්‍යයෝ වූහ. එහෙත් ඔහු පරාක්‍රම පාණ්ඩ්‍යගේ පක්ෂයට ආධාර කළේ කුලසේකර පාණ්ඩ්‍ය චෝළයින් හා අත්වැල් බැඳ සිටි බැවිනි. එනිසා මෙහි එක් අරමුණක් වූයේ පාණ්ඩ්‍ය දේශය චෝළ සාමාජිකයින් වීම වැළැක්වීමයි. මුල් අවස්ථාවේ පාණ්ඩ්‍ය පාලකයා වූ වීර පාණ්ඩ්‍යයට උදව් දී සිහසුන් ගත කළ ද නැවත සිංහල රජු තම විරුද්ධ පක්‍ෂය වූ කුලසේකර පාණ්ඩ්‍යට ලෙන්ගතුව පාක්ෂික වූ බවට හෙළිදරවු වීම (නිකලොස්, 1972:460) මේ තත්ත්වය මනාව අනාවරණය කරයි. මෙම දෙබිඩි විදේශ ප්‍රතිපත්තියේ යථාර්ථය වන්නේ අන් කිසිවක් නොව කලාපීය දේශපාලන බල තුලනය රැකගැනීම බව වඩාත් ගැඹුරින් පරීක්‍ෂා කිරීමේදී පැහැදිලි වෙයි.

අනෙක් පසින් බලන විට මේ සටන සිදුව ඇති ප්‍රදේශයේ භූමි ශාස්ත්‍රීය විග්‍රයක් කළහොත් එය බෙංගාල බොක්ක මුහුදු කලාපයට මුහුණලා තිබූ සුවිශේෂි ප්‍රදේශයකි. පෝක් සමුද්‍ර සන්ධිය හරහා ශ්‍රී ලංකාවත් පාණ්ඩ්‍ය දේශයත් වෙන්ව පිහිටියත් මහාතිත්ථ, තලෙයිමන්නාරම, ධනුෂ්කෝටි, රාමේෂ්වරම්, කුණ්ඩුකාල් සහ වඩලි යන ප්‍රදේශ හරහා ඉතා සමීප සම්බන්ධයක් ද දෙරට අතර විය. එසේම ශ්‍රී ලංකාවේ වයඹ දිග මුහුදු කලාපයත්, පාණ්ඩ්‍ය දේශයේ සාගරාභිමුඛ කලාපයත් සමාන මුහුදු සම්පත් සහිත කලාප විය. වෙළෙඳ කටයුතු තුළදී මේ දෙරාජ්‍යයේ වාණිජ සම්පත් එකම කාණ්ඩයකට අන්තර්ග්‍රහණය වී ඇති නිසා පළමුවැනි පරාක්‍රමබාහු රජුට පාණ්ඩ්‍ය භූමිය ඉතාම වැදගත් කලාපයක් විය. එහි රාජත්වය සම්බන්ධයෙන් චෝළ මැදිහත් වීමක් ඇතිවීම පළමුවැනි පරාක්‍රමබාහු රජුගේ වෙළෙඳ අරමුණුවලට සෘණාත්මක බලපෑම් එල්ල කරන්නකි.

එබැවින් පළමුවැනි පරාක්‍රමබාහු රජුගේ පාණ්ඩ්‍ය අරගලයේ දායකත්වය වත්මන් ඇසින් බලා ප්‍රතිඵල රහිත, නිෂ්ඵල ක්‍රියාවකැයි නිගමනය කිරීම සාවද්‍ය වේ. දීර්ඝ කාලීනව පැවතුණ යුද්ධයෙහිලා විශාල ධනයක් ශ්‍රමයක් ලක් රජුගෙන් වැයවන්නට ඇතත්, දක්ඛිණ දේශාධිපතිව සිටි අවධියේ සිටම අයවැය බලා කටයුතු කළ බව (*මව.* LXIX:28-29) සනාථ වන හෙයින් තමාට හෝ සිය රාජ්‍යයට අහිතකර විදේශ ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැංවූයේ යැයි සිතීම සාධාරණ නොවේ. එමෙන්ම යුද්ධයේ පළමු ජයග්‍රාහී අවධිය සැලකිල්ලට ගැනීමේදී පරාක්‍රමබාහු රජුගේ හමුදා දීර්ඝ කාලයක් යුද්ධ කරමින් පාණ්ඩ්‍ය දේශයේ රාජ්‍ය බලය තම ආධාරක පක්ෂයට ලබාදී තිබූ නිසා ඒ කාලය තුළ යුද්ධවලදී අත්පත් කර ගත් ධනයක් එරට වාණිජ සම්පතුත් තම රටට ලැබීමට සැලැස්වූ බව අනුමාන කළ හැකිය. මෙහිලා නිදසුනක් ලෙස යුද්ධයේ මුල් අවස්ථාවේ යුධ සිරකරුවන් ලෙස අල්ලා ගන්නා ලද දමිළයින් ශ්‍රී ලංකාවට එවා ඔවුන්ගේ ශ්‍රමය යොදා මුල් චෝළ පාලන සමයේ වනසා දා තිබූ මහා සෑයේ ප්‍රතිසංස්කරණ වැඩ සඳහා යෙදවූ බව දක්වෙන වංසකථා පුවත

පෙන්වා දිය හැකිය (*මව.* LXXVI:104-105). එනිසා එහි ශ්‍රමය පවා අපතේ නොයවා මෙරට සේවයට යොදවා ඇත.

තවද මෙම සටන්වලදී පාණ්ඩ්‍ය දේශයේ ප්‍රදේශ ගණනාවක් කොල්ල කෑ බවට ද සාක්ෂි වේ. නිදසුන් ලෙස, රාමේෂ්වරය අත්පත් කොට එම දේවාලයේ වස්තු පැහැර ගැනීම (වෛද්‍යනාථන්, 1972:470) හා වීරගංග රට කුණප්පුනල්නූරය කොල්ලකෑම (*මව.* LXXVI:133) දැක්විය හැකිය. මේ යුද්ධයේ දී ඇති වූ ආර්ථිකමය වාසි සැළකීමේදී "යටත් කර ගනු ලැබූ ප්‍රදේශවල වෙස්සයෝ (සං.වෛශ්‍යයෝ)ද, අරාබීන්ගෙන් පැවතෙන්නන් වැඩි දෙනෙකු ඇතුළු යවනයෝද ජයග්‍රාහක සිංහල සේනාපතියාට තුටු පඬුරු පිරිනැමූහයි" (නිකොලස්, 1972:454) කියැවෙන සඳහන සැළකීමේ දී වෛශ්‍යයෝ යනු වෙළෙඳුන් බවත් යවනයන් යනු පාණ්ඩ්‍ය දේශයේ නතරව සිටි මුස්ලිම් වෙළෙඳුන් ලෙසත් අර්ථ දැක්විය හැකි හෙයින් පරාක්‍රමබාහුගේ මෙම ආක්‍රමණශීලී විදේශ ප්‍රතිපත්තියෙන් සැළකිය යුතු වාණිජ වැදගත්කමක් අත්පත් කරගත්තේ යැයි පෙන්වා දිය හැකිය. මෙම යුද්ධයේ සිංහලයන් සාර්ථක වූ අවධියේ එම සේනාවන් තංජෝර් දිස්ත්‍රික්කයට අයත්, වඩමණමෙක්කුණ්ඩි, මණමේක්කුණ්ඩි හා මඤ්චක්කුණ්ඩි යන ගම් ගිනිබත් කරමින් චෝළ රාජ්‍යයේ සැතැප්ම දාහතරක් පමණ විනාශ කළ බව කියැවේ (*මව.* LXXVII:87-90). තංජෝර් යනු ධනයෙන් අනූන චෝළ අගනුවරයි. හුදෙක්ම පාණ්ඩ්‍ය දේශයේ වාණිජ ආධිපත්‍ය ඔහු සිය ග්‍රහණයට ගත් බවක් විසද වේ. වෙළෙඳුන්, වෙළෙඳ භාණ්ඩ, වස්තු කොල්ල කෑම්, නොමිලේ ශ්‍රමය ගෙන ඒම් ආදී සියල්ල වාණිජ කටයුතු හා බැඳුණු වත්කම් වේ. එබැවින් මෙහිදී විචාරකයින් පෙන්වා දෙන තරම් ලක් රජුට මෙම විදේශ ප්‍රතිපත්තියෙන් හානියක් වූ බවක් නොපෙනේ.

මහාවංසයේ නොදැක්වෙන, එහෙත් චෝළ සෙල්ලිපිවලින් හෙළි වන සාක්ෂි අනුව යුද්ධයේ දෙවැනි භාගයේ දී සිංහලයින් චෝළයින් අතින් පරාජයට පත් වී ඇති බව සනාථවන නිසා අවසානයේ අපේක්ෂිත ජයග්‍රහණය ගිලිහී ගොස් තිබේ. එහෙත් ඒ වන විට කාලය වසර දෙකක්ම ගත වී තිබී ඇත (නිකොලස්, 1972:458). එනිසා එම කාලයේ සැළකිය යුතු වස්තු සම්භාරයක් ප්‍රදේශ කොල්ලකෑම් හරහා මෙරටට ලැබී ඇති බවත්, අනෙක් පසින් එකී කාලය තුළ චෝළ අවධානය පාණ්ඩ්‍ය දේශය වෙත යොමු කරවා, පළමුවැනි පරාක්‍රමබාහු රජු ඉන්දීය සාගර වෙළඳාමේ බෙංගාල බොක්ක අවට කලාපීය බලවතා ලෙස නිදහසේ මැදිහත්ව විශාල ආර්ථික ලාභ රට තුළට ගෙන්වා ගැනීමට සමත් වී ඇති බවක් සිතිය හැකිය. තවද යුද්ධයේ දෙවැනි අදියරේදී චෝළ සෙල්ලිපි ප්‍රකාරව සිංහල සේනාපතියන් වූ ලංකාපුර, ජගත්විජය වැනි අය මරණයට පත්ව යුද්ධය පරාජය වුවත් පළමුවැනි පරාක්‍රමබාහු රජු සටන අත්හැරියේ නැත (එම. 459). යළිත් ඔහු දකුණු ඉන්දියාව ආක්‍රමණය කිරීමට ඌරාතුරෙයි වරායෙහි, පුලෛච්චේරි, මාතෝට්ටම්, වල්ලිකාමම් (වලිකාමම්), මට්ටිවාල් (මුට්ටුවිල්) ආදී තැන්වල සේනා රැස්කරමින්, නැව් තනවමින් සිටි බවත් එය සැලවූ පසු චෝළ රජු තමා යටතේ රැකවල් සිටි සිංහල කුමාරයකුගේ (ශ්‍රී

වල්ලභ) ආධාර ඇතිව සේනා මෙහෙයවා පුලෙච්චේරිය, මාතෝට්ටම් ඇතුළු ස්ථාන කීයක් වටලා විනාශ කර ඇතුන් හා වස්තුව අල්ලා ප්‍රදේශ ගිනි තබා චෝළ රට ගිය බවත් දක්වේ (එම.).

අනතුරුව සිය විදේශ ප්‍රතිපත්තිය වෙනස් කළ පළමුවැනි පරාක්‍රමබාහු රජු මුලදී චෝළ අධාර ඇතිව බලයට පත් වූ කුලසේකර පාණ්ඩ්‍ය සමඟ සංධානයකට එළඹ චෝළයින්ට විරුද්ධව නැගී සිටියේ ය (එම.). එපමණක් නොව නව මිත්‍ර සබඳතා තරකර ගැනීමට කුලසේකර පාණ්ඩ්‍ය වෙත තුටුපඬුරු රැගත් දූතයින් ද යවා ඇති අතර එම පිරිස් අතරමඟදී චෝළයින් විසින් පැහැරගෙන ඇත (එම.). මෙයින් වඩාත් තහවුරු වන්නේ පරාක්‍රමබාහු රජු පාණ්ඩ්‍ය දේශය චෝළ ග්‍රහණයට ඒම වැළැක්වීමෙහිලාත්, එමෙන්ම, පාණ්ඩ්‍ය චෝළ සේනා ස්වාධීනව පැවතීම වැළැක්වීමෙහිලාත්, අනෙක් පසින් චෝළ-පාණ්ඩ්‍ය සතුරු රාජ්‍යයන් ලෙස පවත්වා ගැනීමෙහිලාත් දැඩි උත්සාහයක් ගත් බවයි. එකී අරමුණ තෘප්ත කරගැනීමේ දී ඔහුට ආර්ථික වැය භාරයක් දරන්නට වූ බව පිළිගත යුත්තක් වුවත්, තත් කාලපරිච්ඡේදයේ මෙරට වැසියන් රාජ්‍ය විරෝධීව නැගී සිටි බවක් හෝ වේලෛයික්කාර, අගම්පඩි හමුදාවන් ආක්‍රමණශීලීව හැසිරුණු බවක් හෝ රට ආර්ථික පීඩනයකට ලක් වූ බවක් හෝ නොකියැවෙන බැවින්, ඔහු රට තුළ මනා ආර්ථික පරිපාලනයක් අඛණ්ඩව මෙම විදේශ ප්‍රතිපත්තිය හරහා ගෙනගොස් ඇති බව පෙනේ. එනිසා උක්ත සඳහන් සියළු ක්‍රියාමාර්ගවල ඔහු නියැලීමේ මුඛ්‍ය පරමාර්ථය වූයේ දකුණු ඉන්දියාව දේශපාලන වශයෙන් අස්ථාවර කර බෙංගාල බොක්ක මුහුදු කලාපයේ සංකේන්ද්‍රණය වූ සාගර වෙළෙඳපොළේ ප්‍රබල මැදිහත්කරුවා ලෙස ආධිපත්‍ය රඳවමින් සිංහල දේශයට ආර්ථික ලාභ ගෙන ඒමයි. ඔහුගේ එම ව්‍යායාමය සාර්ථක වූ බව පොළොන්නරුවේ ඇති පරාක්‍රම සමුද්‍රය, ආගමික නිර්මාණ හා නටබුන් ගොඩනැගිලි තුළින් මනාව විසද වේ. වාණිජ ප්‍රතිලාභවල අතිරික්තය එවා තුළින් ලෝකයට නිහඬව කියාපායි.

මින් අනතුරුව බලයට එන පාලකයින් අතරින් නිශ්ශංකමල්ල රාජ්‍ය අවධිය විදේශ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම අතින් වැදගත් අවධියක් වේ. වංසකථාවල ඔහු පිළිබඳ තොරතුරු බෙහෙවින් සීමා සහිත වුවත් ස්වකීය සෙල්ලිපි මූලාශ්‍ර තුළින් තත් අවධියේ විදේශ ප්‍රතිපත්තිය හැදෑරීමෙහිලා යම් ආලෝකයක් ලැබේ. ඔහුගේ මිත්‍රශීලී විදේශ සබඳතා පූර්වයෙන් දක්වන ලද අතර ආක්‍රමණශීලී විදේශ ප්‍රතිපත්තියක ද නියැලුණු බව සෙල්ලිපි කිහිපයකින් අනාවරණය වේ. ඊට අනුව චෝළ, පාණ්ඩ්‍ය රාජ්‍යයන් ආක්‍රමණය කර ඒවායින් කප්පම් ලබාගත් බව ඇතැම් සෙල්ලිපිවල ඇති අතර (*EZ*, I:134; II:152-156,289; III:331) ගල්මැටියාන් වැව සෙල්ලිපියේ පාණ්ඩ්‍ය ආක්‍රමණ සිහිවීමට 'පණ්ඩුවිජය කුලම' වැව තැනූ බවත් දක්වා තිබේ (කිරිබමුණේ, 1972:497). මෙම සඳහන් අතිශයෝක්ති සහිතව තම ශ්‍රේෂ්ඨත්වය පෙන්වීම සඳහා යොදා ඇති බවක් යමෙකුට සිතිය හැකි වුවත් ඒවා නිර්ඓතිහාසික දේවල් යයි බැහැර කළ

නොහැක්කේ ඔහුගේ සෙල්ලිපියක් දකුණු ඉන්දියාවේ රාමේෂ්වරම්හි තිබී හමුව ඇති බැවිනි. එහි ඇති සඳහන් අනුව ඔහු විශාල ධන පරිත්‍යාගයකින් එම දේවාලයේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකර ඇති අතර ඔහු වෙනුවෙන් නැටුම් ගැයුම් නැරඹුම් ආසනයක් ද එහි වෙන් කොට ඇත (කිරිබමුණේ, 1972:497). මෙම සාක්ෂිය සැළකුව හොත් රාමේෂ්වරම් පිහිටි දූපත පිළිබඳව කිසියම් හිමිකාරීත්වයක් නිශ්ශංකමල්ල රජුට තිබී ඇත. එය නිශ්ශංකමල්ල රජු පාණ්ඩ්‍ය දේශයේ දී ලද කිසියම් ජයග්‍රහණයක් තහවුරු කරවන්නකි (කිරිබමුණේ, 1972:499). මේ සඳහා ආලෝකයක් සපයන තවත් සාධකයක් සහස්සමල්ල පුවරු ලිපියෙන් හෙළිවේ. ඊට අනුව මල්ලිකාර්ජුන විසින් කාලිංගයෙන් කැඳවාගෙන ආ සහස්සමල්ල ශ්‍රී ලංකාවේ දැවුරුදු යුද්ධය අවසන් වන තුරු නතර වී සිටියේ චෝළ මණ්ඩලයේ කොඩපට්ටන නාවික වරායෙහිය (*EZ*, II:223). දකුණු ඉන්දීය සෙල්ලිපි තුනකම සඳහන් වන මෙම ස්ථානය චෝළ දේශයේ "ගංගයිකොණ්ඩ පට්ටන" නම් ඓතිහාසික වාණිජ නගරය යැයි සැළකේ (විජයසූරිය, 1997:140). එනිසා මෙම ලිපි සැසඳීමේදී ඔහු කිසියම් බලපෑමක් දකුණු ඉන්දියාව සම්බන්ධයෙන් සිදුකර ඇති බවත්, ඒ හරහා සිය මලනුවන් කහකොණ්ඩ වරායේ නවතාසිටීම හා රමේෂ්වරම් සබඳතාව එකිනෙකට ඇඳුණු ක්‍රියාවන් ලෙසත් අනුමාන කළ හැක.

මේ අනුව උක්ත තොරතුරු විශ්ලේෂණාත්මකව විචාරයට ගැනීමේදී පොළොන්නරු පාලකයින් සිය දේශපාලන බලය ස්ථාවර කරගැනීම හා පවත්වා ගැනීමේදී විදේශ ප්‍රතිපත්තිය පෙර පාලකයින් මෙන්ම යොදාගත් බව පැහැදිළිය. එහෙත් පූර්ව අවධීන්ට සාපේක්ෂව සලකා බැලීමේදී විවාහ ප්‍රතිපත්තිය හරහා කලාපීය මිත්‍ර හවුලක් ගොඩනගා ගැනීමට උත්සුක වීම, කලාපීය බල තුලනය රැක ගැනීමට මහත් වෑයමක් දැරීම මෙන්ම වඩාත් ආක්‍රමණශීලී විදේශ ප්‍රතිපත්තියක් ගෙනගොස් තිබීම ආදී ගති ලක්ෂණයන් මෙරට පාලකයින් විදේශ ප්‍රතිපත්තීන් ක්‍රියාවට නැගීමේදී දැක්වූ මහත් කුසලතාවය, දූරදර්ශීභාවය මෙන්ම සැලසුම් සහගත භාවය මනාව පෙන්නුම් කරන අතරම එහි මුඛ්‍ය පරමාර්ථය වී ඇත්තේ ඉන්දීය සාගර වාණිජ ආධිපත්‍ය ශ්‍රී ලාංකේය බල හස්තය වටා ඒකරාශී කර ගනිමින් තත් අවධියේ බෙන්ගාල බොක්ක ආශ්‍රිතව සශ්‍රීකව සිදුකෙරුණු විදේශ වෙළඳාමේ ලාභාංශ මෙරටට ගෙනෙමින් එය මෙරට සංවර්ධන ක්‍රියාවලියට සක්‍රීයව දායක කරගැනීම බව උක්ත කරුණු තුළින් මෙන්ම අදටත් විද්‍යමාන මහා පරිමාන වාරි කර්මාන්ත ඇතුළු නටබුන් සංහාරය මගින්ද නිහඬව කියාපායි. එබැවින් පොළොන්නරු පාලකයින්ගේ විදේශ ප්‍රතිපත්තිය තර්කානුකූල වූත්, බුද්ධිගෝචර වූත් න්‍යායික පදනමක් මත ගොඩනැගී තිබූ බව පෙන්වා දිය හැකි වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ


ඉමාම්, එස්.ඒ. (1962). ***අරාබි-ලංකා සබඳකම්.*** *සිංහල විශ්ව කෝෂය*, 2 කාණ්ඩය.

ඉලංගසිංහ, එම්. (2008). ***පෙරදිග දේශපාලන චින්තනය,*** කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ,

කිරිබමුණේ, එස්. (1966-67). අග්නිදිග ආසියාව හා පැවති ලංකා සබඳකම්. **ඉතිහාස සඟරා**, (3), මරදාන: කැප්ටන් මුද්‍රණාලය,

කිරිබමුණ, එස්. (1972). මහා පරාක්‍රමබාහු රජුගේ අන්තරාගාමිකයෝ. ***ලංකා විශ්වවිද්‍යාලයීය ලංකා ඉතිහාසය,*** I කාණ්ඩය, II භාගය, කැළණිය: විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය,

ගුණවර්ධන, ආර්.ඒ.එල්.එච්. (2000). 'සංග්‍රාම, රාජ්‍යය හා පූර්වීය- ලෝක ආර්ථිකය. ***උරුමයක ආවර්ජන***, කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල.

නිකලොස්, සී.ඩබ්. (1972). I වැනි පරාක්‍රමබාහු රජුගේ රාජ්‍ය කාලය. ***ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය.*** I කණ්ඩය, II භාගය, කැළණිය: විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය,

පරණවිතාන, ඇස්. (1972). මේ යුගයේ සභ්‍යත්වය: අර්ථ, දේශපාලන හා සමාජ තත්ත්ව. ***ලංකාවිශ්වවිද්‍යාලයීය ලංකා ඉතිහාසය***, I කාණ්ඩය II භාගය, කැළණිය: විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය,

***මහාවංසය.*** (2007). සංස්. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, බටුවන්තුඩාවේ දේවරක්ෂිත, කොළඹ: බෞද්ධ කටයුතු මධ්‍යස්ථානය.

රෝහණදීර, එම්. (2000). සුඛෝදය යුගයට පෙර ශ්‍රී ලංකාව හා තායිලන්තය අතර පැවති සංස්කෘතික සම්බන්ධතා දර්ශන පථ, ***උරුමයක ආවර්ජන***, කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල,

වෛද්‍යනාථන්, ශ්‍රී කේ. ඇස්. (1972). පාණ්ඩ්‍ය දේශයෙහි ලංකාපුර කළ යුද්ධ ව්‍යාපාරය පිළිබඳ භූමි ශාස්ත්‍රීය විමංසනයක්, ***ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය.*** I කණ්ඩය, II භාගය, කැළණිය, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය,

විජයසූරිය ඩබ්. (1997). සාහසමල්ල පුවරු ලිපිය පිළිබඳ පුනරාවලෝකනයක්. ***පොළොන්නරු ලිපි සංගීතා,*** කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,

සිරිවීර, අයි. (2001). ***රජරට ශිෂ්ටාචාරය හා නිරිත දිග රාජධානී,*** කොළඹ: දයාවංශ ජයකොඩි සහ සමාගම,

ශාස්ත්‍රී, එන්. (1964). ලම්බකර්ණ පෙළපත, ***ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය,*** I කණ්ඩය, Iභාගය, කැලණිය: විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය,

Dewaraja, L. (2003). Muslim Merchants & Pilgrims in Sarandib, 900-1500 AD. ***Sri Lanka & Silk Road of the Sea,*** Colombo: Sri Lanka Institute of International Relations.

***Epigraphia Zeylanica,*** (1912). (ed.) D.M.D.Z.Wikramasingha, Vol.I, London: Oxford University.

***Epigraphia Zeylanica,*** (1928). (ed.) D.M.D.Z.Wikramasingha, Vol.II, London: Oxford University.

***Epigraphia Zeylanica,*** (1933). (ed.) S. Paranavitana, Vol. III, London: Oxford University.

Indrapala, K. (Ed.), (1963). The Nainative Tamil Inscription of Parakramabahu I. ***University of Ceylon Review,*** Colombo: XXI (1), University of Ceylon.

Sasthre, N.K.A., (1955). ***The Colas,*** 2nd Edition, Madras: University of Madras.